# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1827/12 – 2013 සැප්තැම්බර් 11 වැනි බදාදා – 2013.09.11

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/39/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්ලිව්. පී. පෙරේරා මිය., අංක 50, දෙවන පියවර, ගැමුණු මාවත, තඹුත්තේගම

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නො. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, නො. 570/බී/1හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

1A – G 18241 – 195 (2013/09)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/15/39/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්ලිව්. පී. පෙරේරා මිය., අංක 50, දෙවන පියවර, ගැමුණු මාවත, තඹුත්තේගම

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නො. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ ඉංජිනේරු II වන ශ්‍රේණියේ සේවය කරන ඩබ්. පී. පෙරේරා මහත්මියට,

1. 1986.01.01 දිනට පෙරදාතම් කර ඉංජිනේරු සහකාර I වන ශ්‍රේණිය ලබා නොදීම.

2. 1999.02.23 දිනට පෙරදාතම් කර තාක්ෂණ ඉංජිනේරු II වන ශ්‍රේණිය ලබා නොදීම.

3. 2002.02.23 දින සිට තාක්ෂණ ඉංජිනේරු I වන ශ්‍රේණිය ලබා නොදීම.

4. 2005.02.23 දින සිට තාක්ෂණ ඉංජිනේරු විශේෂ ශ්‍රේණිය ලබා නොදීම.

යන කරුණුවලින් ඇයට යම් අසාධාරණයක් සිදුවී ඇත්ද? එසේ සිදුවී ඇත්නම් ඇයට කුමන සහනයන් හිමිවිය යුතුව ඇත්ද යන්න වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 1109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.